

**'මා නිවත්ත අභික්කම' - නො නැවත ඉදිරියට යවු**

| | | |
|---|---|---|
| **54 වන කාණ්ඩය** | **බු.ව. 2555 මැදින් මස පුරපසළොස්වකදා ක්‍රි.ව. 2012 බක් මස 07 වන දා** | **10, 11 වන කලප්** |



# මගේ ලක් මව පින්බරයි

බක් මහේ නැකතක් ඇවිත්
සිරිලක් දනන් සුවපත් කරයි
පින්බර යි මගෙ ලක් මවුන්
සිරි ලක් මවුන් හරි පින්බරයි

මල්පලින් බර - ගම් දොරින්
සණ්ටා හඬක් - දුර රැව් නැගේ
පින් හැඟුම් උතුරා ගලයි
සෙනෙහස් සිනා මුව මුව රැඳේ

පන්සලේ මිදුලේ පිරී
සුවහස් දනෝ බුදු ගුණ ගයත්
සෙත් පිරිත් අනුහස් බෙලෙන්
සුබ වාසනා සිරිසෙත් සැදේ

**- සුනිල් සරත් පෙරේරා සූරීහු**

# හිසකෙස් කපා දන් දුන් සුමනාවගේ කථාව

අග්ගමහා පණ්ඩිත **පොල්වත්තේ බුද්ධදත්ථ මහ නා හිමිපාණන්** ලියූ
''ඉතා පැරණි සිංහල බණ කථා'' කෘතියෙනි.

---

සැගිරිය සමීපයෙහි ''විල්ගම'' නැමැති ගමක් විය. එහි පර්වත ගුහාවක බුද්ධ පුත්‍රයෝ වෙසෙත්. එහි වෙසෙන භාවනානුයෝගී වූ සමාහිත වූ සසර භය දක්නා භික්‍ෂූහු සත්නමක් ඒ ගමට පිඬු පිණිස ආහ. පවුල් පන්සියයක් ඇති ඒ ගමෙහි ගෙපිළිවළින් හැසුරුණු ඒ භික්‍ෂූහු කිසිවක් නොලැබ සේදූ පාත්‍ර ඇතිවම ගමෙන් පිටතට පැමිණියහ. ඒ ගමෙහි වසන දුගී වූ මවක් ද දුවක් ද දුගී ශාලාව ආශ්‍රය කොට වසමින් සිඟා කෑමෙන් ජීවත් වෙති. සුමනා නමැති ඒ දුවණියෝ ගමෙන් නික්මුණු ඒ භික්‍ෂූන් දැක සංවේගයට පත් සිතැතිව මෙසේ සිතී.

''අතිශයින් අනුකම්පාවට භාජන වූ මා සතු කිසිවක් නැත. පෙර කුසල් නොකොට දිළිඳු බවට පැමිණියෙමි. මා විසින් මාගේ හිසකෙස් කපා කඩයට ගොස් විකුණා කුශලයක් කරනු ලැබේ නම් යෙහෙකි.'' ඕ මෙසේ සිතා සිත දැඩි කොට ගෙන මව වෙත ගොස් ඇඳිලි බැඳගෙන මෙසේ කීය. ''මෑණියෙනි, අහර නොලත් භික්‍ෂූහු සත්නමක් ගමෙන් නික්මියහ. මට පිනක් කරන්නට අවසර දෙනු මැනවි.'' ''දුවණියෙනි, පින් කරව. මා

නිසා බිය නොවෙව. පිනට අන්තරාය කරන්නේ අපායයන්හි පැසෙන්නේය '' යි මව කීය.

මවගේ කීම ඇසූ ඈ කඩවීදියට ගොස් තමාගේ හිසකෙස් කපා විකුණා කහවනු අටක් ලැබ, ඒවා රැගෙන වහා ගෙය ගොස් ඒ භික්ෂූන් නවත්වා ආසනශාලාවට පැමිණ වීය. එසේ භික්ෂූන් වැඩහිඳුවා තමා ලත් ධනය සත් කොටසක් කොට එක් කොටසකින් හාල් සපයා බත් පිස ශාලාවට ගොස් එය භික්ෂූන්ට පිළිගැන්වී ය. සතුටු සිතින් භික්ෂූන්ට දන් පිළිගැන් වූ සුමනාව මෙසේ ද කීය. මාගේ හිස කෙස් විකුණා මම මේ දානය දෙමි. ඒ දානය මට පසු කලක දී ධන සම්පත් ලැබීමට හේතුවක් වේවා'' සසරෙහි නො ඇලුණු සිතැති ඒ භික්ෂූහු දානය පිළිගෙන ඒ ගමෙන් නික්ම වනයට පිවිසියහ. එයින් වැඩිමහලු තෙරනම එහි මාර්ගය මැද සිටගෙන ඒ භික්ෂූන්ට මෙසේ කීය. ඇවැත්නි, තමාගෙ හිසකෙස් කපා දන් සපයා දුන් මේ සුමනාව කෙලෙස් සිඳින පිරිසක් බව දැන එසේ කළා ය. මම ආශ්‍රවක්ෂයට නොපැමිණ මේ දානය නොවළඳමි. ඒ සඳහා කාලය පැමිණියේ ය. ඔබ ද ඒ කාරණය දත මැනවි. සප්ත සද්ධර්මයෙන් යුක්ත වූ, මෛත්‍රී සහගත සන්හුන් සිතැති ඒ භික්ෂූහු කෙලෙසුන් සිඳීම පිණිස බලවත් උත්සාහ කළහ. ඒ භික්ෂාව පසෙක තබා ගස්මුල් වෙත පැමිණි ඒ සියල්ලෝ දුක් කෙළවර කොට ආහාර අනුභව කළහ.

එතුමන් දානය වැළඳු කෙනෙහි ඒ දැරිය මනා රූ ඇත්තී විය. ඕ දේවවර්ණයට නොපැමිණ මනුෂ්‍ය වර්ණය ඉක්මවා සිටියා ය. සිරුරෙහි වර්ණය ද හිසෙහි දික් වූ කෙස් ද හොබනා අඟ පසඟ ද දැක තරුණිය මෑණියන්ට මෙසේ කීවා ය. මෑණියනි මාගේ රූපය ශෝභන වූවා දකිමි. මෙය මෙලොවදී ම දකින්නට ලැබෙන ඵලයකි. ඒකාන්තයෙන් ඒ මහතෙරුන් රහත්බව පැමිණෙන්නටඇත. ඒ ප්‍රවෘත්තිය අසා අසල්වැසි මිනිස්සු ඒ ගෙට අවුත් පිරිවරාගෙන බොහෝ පැහැදීම ඇති කර ගත්හ.

දේවතාවෝ ද අනුරාධපුරයට ගොස් උද්ඝෝෂණය කළහ. රජුගේ ඡත්‍රයෙහි අධිගෘහිත දේවතාවා ද සාධු කාර දුණි. එයැසු එක් මහායුද්ධ භටයෙක් රථයක නැඟී අවුත් සොයන්නේ එක් පැත්තක සිටි ඒ ස්ත්‍රිය දැක රථයෙහි නංවා ගෙන ඇ රජුට යෝග්‍යයයි සිතා රජු වෙත ගෙනාවේ ය. රජතෙම රන්වන් වූ සුමනාව දැක මෙලොව දී විපාක ලද ඒ දානය කුමක් දැයි විචාළේ ය. රජු විසින් විචාරන ලද ඕ තොමෝ '' මහරජ, මාගේ හිසකෙස්වැටිය කපා විකුණා දන් දුනිමි'යි කීය. එයැසූ රජ සතුටුව ඇය තමාගේ දූ තනතුරෙහි තබා ඇය සොයා ගෙනා යුද්ධ භටයාට ම පාවා දුණි. මෙසේ ඒ දැරිය තමාගේ කෙස් වැටිය කපා විකුණා දන් දී උසස් සම්පතට පැමිණියා ය.

සද්ධාතිස්ස මහරජ ඇට තමාගේ කුමරියකට මෙන් දාසයන් සියයක් ද දෙනුන් සියයක් ද මීමුන් සියයක් ද වාහන සියයක් ද ගම් සියයක් ද ඇති ජනපදයක් ද රජ දුවකට දිය යුතු ආභරණාදිය ද දුන්නේ ය. ඕ තොමෝ මහා දානපතිනියක් විය. ඇගේ මරණාසන්න කාලයේ දී සදෙව්ලොවින් රථ පැමිණියහ.

# හෙළ තෙරුවනක් මැවූ කුමාරතුංග මුනිදාස මහ පඬිතුමා

පසු ගිය මාර්තු 2 වන දාට 68 වන කුමාරතුංග මුනිදාස සමරුව යෙදී තිබිණ. මාර්තු 2 සිංහල භාෂා දිනය වශයෙන් ද නම් කැර ඇත. සිංහල බසට, සිංහල වියරණයට පමණක් නො ව, සිංහල කවිය, විචාරය, ඉතිහාසය, පැරණි ග්‍රන්ථ ශෝධනය, පරිවර්තන, සාහිත්‍ය නිර්මාණය, ළමා පද්‍යය, පුවත් පත් කලාව, සංගීතය, දේශපාලන චින්තනය ආදි නොයෙක් විෂය ක්‍ෂෙත්‍රයන්හි එතුමා සිදු කළ මෙහෙය අද්විතීය ද අසහාය ද වේ. වසර 57 ක ආයු කාලයක් තුළ එ වන් මහ මෙහෙයක් කරන්නට හැකි වීම තව ද විස්මය ජනක කරුණකි.

මැතක දී  මහාචාර්ය සුචරිත ගම්ලත් සූරීන් ජාතික පුවත් පතකට ලියූ ලිපියකින් පහත දැක්වෙන ඡේදය උපුටා ගැනිණි.

''කුමරතුඟු සමරු උලෙළ වසරකට එක් වරක් වත් නො ව, දොළොස් වරක් ම පැවැත්විය යුතු මහඟු උලෙළකි. දවසකට වරක් වත් පැවැත්විය හැකි නම් වඩාත් මහත් ඵල මහානිශංස දායක ය. මම කුමක් හෙයින් මෙසේ කියම් ද? මුනිදාසයන් තරම් අද දින සිංහලයට අදාළ ව මහා උතුමකු මැත අතීත දර්ශන පථයෙහි මට නො දිස්වන බැවිනි.''

**එතුමෝ සිංහල වියරණය නිරවුල් කළහ.**

පාලි සංස්කෘත ව්‍යාකරණ ග්‍රන්ථ ආශ්‍රයෙන් සිංහල වියරණය මතු කරන්නට උත්සාහයක් දැරුණු එ ම අවධියෙහි දී, සිංහල භාෂාවට ආවේණික වූ ස්වාධීන ව්‍යාකරණ ලක්‍ෂණ සිංහල භාෂාවෙන් ම සොයා ගත හැකි බව එතුමෝ පෙන්වා දුන්හ. ව්‍යාකරණ විවරණය, ක්‍රියා විවරණය යන ව්‍යාකරණ ග්‍රන්ථ දෙක ලියා රටට පෙන්වූයේ එ ම කරුණ ඉස්මතු කරන්නට යි. විශේෂයෙන් ම අවුල් ස්වභාවයකින් තුබුණු සිංහල ක්‍රියා වරනැඟීම ගණ හයකට බෙදා නිරවුල් කොට ඉදිරිපත් කළෝ කුමාරතුංගයෝ ය.

**එතුමෝ පැරැණි ග්‍රන්ථ පිරිසිදු කොට දැක්වූහ.**

පරිහානි යුගවල දී පිරිහීමට පත් ව තිබූ සිංහල භාෂාව දියුණු තත්ත්වයකට ගෙන එන්නට කුමාරතුංගයෝ කල්පනා කළහ. ඒ සඳහා ඔවුන් මුලින් ම කළේ පැරැණි වටිනා සිංහල ග්‍රන්ථවල දොස් හැර, පිරිසිදු නිවැරදි යෙදුම් මතු කොට ඉදිරිපත් කිරීම යි. එසේ එතුමෝ පැරැණි ග්‍රන්ථ 32 ක් විවරණය කොට ගැට මුසු තැන් එළි පෙහෙළි කොට දැක්වූහ.

**එතුමෝ මහ කිවියාණ කෙනෙකි.**

මහ කිවියකුට ඇවැසි බස් දැනුම, ලෝ දැනුම, රස දැනුම යන තුන් නුවණින් පිරිපුන් ව සිටි කුමාරතුංගයෝ සිංහල කවියට නව පණක් දුන් වියතාණ කෙනෙකි. කව් රචනා කරන්නවුන් සඳහා එතුමෝ ''විරිත් වැකිය'' නමින් උසස් ග්‍රන්ථයක් සම්පාදනය කළහ. ජාතියේ නිදහස උදෙසා පළමු ව සිත නිදහස් කර තැබිය යුතු යැ යි ඔහු අභීතව ප්‍රකාශ කළහ.

ඔබ මහ කිවියෙක්

වෙත් වා අරුත් පද වැකි

හැම පිරිසුදු වී නැඟැ

ඔබට මඟ සලසා වා !

යනු ''විරිත් වැකියෙහි'' දී එතුමා නව කිවියන් කෙරෙහි දැක්වූ පැතුම විය.

ගස වතු සුදු - වී පිරිසිදු

පොහොය නැතදු - සිල් ගත් බඳු

වැනි මනහර ළමා පැදි රැසක් එතුමන් අතින් නිර්මාණ විණි.

**එතුමෝ නිර්භය විචාරකයෙකි.**

සිංහල විචාර කලාවේ නව ඉසවු සොයා යන්නට මං පෙත් විවර කළෝ කුමාරතුංග පඬිතුමාණෝ ය. ''දෙවියකු කී දයක් වත් කරුණු නැති ව නො අදහනු'' යි කී එතුමෝ කාව්‍යශේඛර විවරණ සංඥාපනයෙහි මෙසේ ද සඳහන් කළහ: ''හොරුන් පොලිසිය නුරුස්නා සේ දුර්වලයෝ විචාරකයන් නුරුසිති. විචාරණයක් කළ හොත් තමන් ගේ ඇති පදම් ලොවට හෙළි වන බව දන්නා හෙයිනි. එහෙත් දියුණුවක් වන්නට නම්, අන් සියල්ලට ම වඩා තියුණු කළ යුත්තේ විචාරණය යි.''

මෙ ලෙස ඉතා පුළුල් ලෙස විවිධ ඉසවුවල තියුණු නුවණින් කළ සේවාව වියතුන් ගේ මහත් පැසසුමට ලක් විය.

කුමාරතුංගයෝ හෙළ බස, හෙළ රැස, හෙළ දෙස තුනුරුවනක් කොට සැලැකූහ. අපට ඇති ඉහළ ම රුවන් තුන බුදුන් - දහම් - සඟුන් වන්නා සේ ම මෙ ලොව සංවර්ධනයට බලවත් ලෙස පිටුබලයක් සපයන්නේ බස - රැස - දෙස පිළිබඳ සැබෑ ඇල්ම බව එතුමෝ බොහෝ වර පැවැසූ හ.

'මා බස, රුස, දෙස
වේ මගෙ මතැ හිස'

යනුවෙන් ප්‍රකාශ කළ කුමරතුගු පඬිතුමා පෞරුෂය, අභිමානය, භාෂානුරාගය, ස්වාධීනත්වය, අපෞද්ගලික විචාරය, නිවැරදි බස් වහර යන මේ ඈ කරුණු පිළිබඳ ව පළ කළ උතුම් අදහස් හැමදා ම අගයෙන් අනූන ව පවතින බව සඳහන් කළ යුතු යි. පාණ්ඩිත්‍යය, කවිත්වය, අව්‍යාජත්වය, මානුෂිකත්වය හා ව්‍යුත්පාදක ශක්තිය ඈ වෙසෙස් ලකුණුවලින් අතිශයින් ම ප්‍රකට ව පිරිපුන් මෑත ඉතිහාසයේ යම් චරිත ප්‍රභාවක් වී නම් ඒ කුමාරතුංග මුනිදාසයෝ ම ය යනු අප විසින් පිළිගත යුතු කරුණකි.

**"සකසු" විසිනි**



# මිතුරෝ

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ හිටපු හැන්සාඩ් සංස්කාරක
**පී. ටී. විජයදාස සූරිහු**

සැපයෙදි පමණක් එක් ව සිටින්නෝ
දුක ලැබෙනා විට මඟ හැර යන්නෝ
පින් පව් ගැන සැලකිලි නොකරන්නෝ
පාප මිතුරු ගණයට පත් වන්නෝ

වරද දැක්ක තැන එය දක්වන්නෝ
නිවැරදි වන්නට උපදෙස් දෙන්නෝ
දුක-සැප දෙකෙහි ම සම ව සිටින්නෝ
සැබැවින් මත් හොඳ මිතුරෝ වන්නෝ

'කළු' නසමින් 'සුදු' ගෙනෙනු කැමැත්තෝ
ඒ නයින් දැනටත් පල ලැබ ගත්තෝ
දැන ගත්තට පසු දැක ගෙන ඇත්තෝ
කලණ මිතුරු ලෙස සැලැකිය යුත්තෝ

පාප මිතුරු ඇසුරෙහි රඳනා විට
අවැඩක් මත් වෙයි, ඒ ලොවට මෙ ලොවට
නිවැරදි ලෙස උන් හඳුනා ගන්නට
තියුණු නුවණ ඇවැසි ම වේ කෙනෙකුට

පව් කම් නොකරන යුතුකම් සලකන
දහමට ළැදි වන ගුණයට තැන දෙන
හොඳ මිතුරන්ගේ ඇසුරක් හිමි වන
අය හට යහපත සැලැසෙයි හැම දින

# පියාණන් වහන්සේ ගේ සෙවණැල්ල

සිරි වජිරාරාමවාසී ව වැඩ විසූ
**පූජ්‍ය පඹුරන මෙත්තෙය්‍ය හිමිපාණන් විසිනි**

---

මාගේ පින්වත් දරුවනට සිත සැනැසෙන කථාවක් කියමි. පින්වත් පුතුනි, බුදු පියාණන් වහන්සේ කපිලවස්තු පුරයට වැඩි සත්වන දින යශෝධරා මාතාවෝ රාහුල කුමරුන් සව් බරණින් සදා බුදුපියාණන් වහන්සේ පෙන්වා '' අන්න, පුතා තාත්තා, අර විසි දහසක් ශාන්ත වූ සාධූන් වහන්සේ පිරිවරා තරු පිරිවැරූ සඳ සේ වැඩ සිටිනා සේක් පුතුණුවන් ගේ පියාණන් වහන්සේ ය. ළඟට ගොස් පියාණන් වහන්සේ ගෙන් දායාද ඉල්ලා ගන්නැ''යි කීහ.

බුදු පියාණන් වහන්සේ ළඟට ගිය රාහුල පුතණුවනට පියාණන් වහන්සේ ගේ සිල් සුවඳ දැනුණේ ය. කරුණා සීතලය දැනුණේ ය. මෛත්‍රී මිහිර දැනුණේ ය. කුඩා රාහුල පුතණුවෝ සුවයෙනුත් සුවයට පත් ව සතුටිනුත් සතුටට පත් ව, 'පියාණන් වහන්ස, මට නුඹ වහන්සේ ගේ සෙවණැල්ලත් සුව යැ''යි කීහ.

අනේ මාගේ පින්වත් දරුපැටවු ද තුනුරුවන් සෙවණේ හැම කල් ම සුවයෙන් වෙසෙත්වා !

මාගේ පින්වත් දරුපැටවු ද සව්සත්නට මව් පියන් බඳු වූ මහා සංඝයා වහන්සේ සෙවණේ හැම කල්හි ම සුවයෙන් වෙසෙත්වා !

මාගේ පින්වත් දරුවෝ "**බුද්ධං සරණං ගච්ඡාමි, ධම්මං සරණං ගච්ඡාමි, සංඝං සරණං ගච්ඡාමි**" යි තුන්ලොවට පරම පිහිට වූ තුනුරුවන් සරණ ගොස් "සියලු සත්ත්වයෝ සුවපත් වෙත්වා ! " යි භාවනා කොට සුව සේ සැතැපෙත්වා ! සුව සේ පුබුදිත්වා !

මාගේ පින්වත් දරුවෝ තුනුරුවන් සරණ ගියා වූ ද සව් සත්නට ම මවුන් වැනි වූ ද උතුම් බෞද්ධ මැණිවරුන් තුරුල්ලෙහි සුවයෙන් වෙසෙත්වා !

මාගේ පින්වත් දරුවන් ගේ සිතිවිලිත් ලොවට සුව දෙත්වා !

මාගේ පින්වත් දරුවන් ගේ වචනත් ලොවට සුව දෙත්වා !

මාගේ පින්වත් දරුවන් ගේ ක්‍රියාත් ලොවට සුව දෙත්වා !

මාගේ පින්වත් දරුවන් ගේ සෙවණැල්ලත් ලොවට සුව දෙත්වා !

මාගේ පින්වත් දරුවෝ බුදුපියාණන් වහන්සේ ගේ සෙවණැල්ල මෙන් සව්සත්නට සුව දෙමින් ඉතා ශාන්ත ව වෙසෙත්වා !

"සියලු සත්ත්වයෝ සුවපත් වෙත්වා !"

# බුදුරදුන්ගේ ගුරු භූමිකාව

රත්මලාන සිරි රත්නාරාමාධිපති
කොළඹ තර්ස්ටන් මහ විදුහලේ නියෝජ්‍ය විදුහල්පති
**පූජ්‍ය සූරියගොඩ සිරිධම්ම නාහිමිපාණන් විසිනි.**

---

මානව සමාජයේ වගකීම් සම්භාරයක් උසුලන ගෞරවාන්විත සේවාවක නියුතු උතුමෙකු ලෙස ගුරුතුමා නම් කළ හැකි ය. දරුවන්ගේ දක්ෂතා දැන හැඳින එම හැකියාවන් වර්ධනය කොට යහපත් පුරවැසියකු බිහිකිරීම ගුරුවරයාගෙන් ඉටු විය යුතු කාර්යභාරයකි. ආගමික ශාස්තෘවරයකුගේ ගුරු භූමිකාව ඊට වඩා විහිදී යන මහඟු මෙහෙවරකි. උන්වහන්සේගේ ඉගැන්වීම් ක්‍රමවේදය මෙලොව යහපත පිණිස පමණක් නොව පරලොව ශුභසිද්ධිය හා අවසාන මෝක්ෂය ද ළඟාකර දෙන්නක් විය යුතු ය. එබඳු ආගමික ගුරුවරුන් අතර අද්විතීය ස්ථානයෙහි වැජඹෙන්නේ අප බුදුරජාණන් වහන්සේ බව බෞද්ධ අබෞද්ධ උගතුන්ගේ සහ බුද්ධිමතුන්ගේ පිළිගැනීමයි.

බුදුපියාණන්ගේ තක්සලාව විටෙක උද්‍යානයකි. තව විටෙක අමු සොහොනකි. නැතහොත් ගල් ලෙනකි. ගල් තලාවකි. නැති නම් වැලි තලාවකි. තවත් විටෙක වනස්පති වෘක්ෂ මූලයකි. මහ වනයකි.

එකල පැවැති ප්‍රධාන ම අධ්‍යාපන ක්‍රමවේදය දේශනාවයි. ශ්‍රාවකයා යනු දේශනාවට ඇහුම්කන් දෙන ශිෂ්‍යයා ය. ශිෂ්‍යයා බොහෝ දේ අසා ධාරණය කරගත් විට බහුශ්‍රැත නම් වෙයි. බුදුරජාණන් වහන්සේ තම ශිෂ්‍යයන්ට ඉගැන්වීමේ දී දෘශ්‍යමය සාධකයන් ද ඉදිරිපත් කළහ. උන්වහන්සේ සිංසපා වනයේ දී කොළ මිටක් අතට ගෙන ''මහණෙනි, මගේ අතේ තිබෙන කොළ ද වැඩි? මේ වනයේ තිබෙන කොළ දැයි විමසූහ. භික්ෂූන්ගේ පිළිතුර වූයේ වනයේ තිබෙන කොළ වැඩි බවයි. එසේම මිනිසත් බව ලැබ නැවත මිනිසත් බව ලබා ගන්නා පිරිස, අතේ ඇති කොළ මෙන් ස්වල්ප දෙනෙකැයි ද වනයේ තිබෙන කොළ මෙන් දුගතිගාමී වන්නන් බහුල බවත් පෙන්වා දුන්හ.

රාහුල පොඩි හිමි කලක් අම්බලට්ඨිකාවෙහි විසී ය. දිනක් උන්වහන්සේ බැලීමට බුදුරජාණන් වහන්සේ වැඩම කළහ. බුදුරදුන් වඩින බව දුරදීම දුටු රාහුල පොඩි හිමි, අසුනක් පනවා පා දෙවීමට වතුර භාජනයක් ද තැබී ය. බුදුරදුන් වැඩම කොට අසුනෙහි වාඩි වී අනතුරුව පා දෙවී ය. බඳුනෙහි දිය ටිකක් ඉතුරු කළ බුදුපියාණෝ ''රාහුල, බඳුනෙහි ඇති දිය ස්වල්පය පෙනෙනවාදැයි විමසූහ. 'පෙනෙනවා' යන්න රාහුල හිමියන්ගේ පිළිතුර විය. ''රාහුල, යම් කිසි ශ්‍රමණයෙක් දැන දැන බොරු කියන්නේ නම් ඔහුගේ මහණකමත් මේ දිය ස්වල්පය මෙන් ඉතා අඩුයි. ඊළඟට ඒ වතුර ස්වල්පය ද ඉවත ලූ බුදුරජාණන් වහන්සේ ''රාහුල, දැන දැන බොරු කියන ශ්‍රමණයාගේ මහණකමත් මේ දිය නැති බඳුන මෙන් හිස් යැයි වදාළ සේක. අනතුරුව බඳුන මුනින් නැමූ බුදුහිමි ''රාහුල, දැන දැන බොරු කියන පැවිද්දාගේ මහණකමත් මුනින් නැමූ බඳුන මෙනැ'යි පවසා රාහුල හිමියන්ට බොරු නො කියන ලෙස අවවාද කළ සේක. අනතුරුව කැඩපත දෘශ්‍යමාන සාධකයක් ලෙස ගෙන පාඩමක් ඉගැන්වී ය.

චුල්ලපන්ථක පොඩි හිමියන්ට හාර මාසයකිනිදු සතර පද ගාථාවක් වනපොත් කරගත නො හැකි විය. මේ නිසා මහාපන්ථක හිමි උන්වහන්සේට ගිහිව ගෙදර යන්නට නියම කෙළේ ය. හිම්දිරි පාන්දර සිවුරු හැරීමට යන පොඩි හිමියන්ට බුදු හිමි මුණ ගැසුණි. තොරතුරු අසා දන පොඩි හිමියන් ගඳකිළියට කැඳවාගෙන ගොස් වාඩිවීමට සලසා සුදු රෙදි කැබැල්ලක් දී ''**රජොහරණං, රජොහරණං**'' කියමින් පිරිමදින්නට නියම කළහ. චුල්ලපන්ථක හිමි සුදු රෙදි කැබැල්ල පිරිමදියි. හිරු උදාවෙයි. දහඩිය දමයි. රෙදි කැබැල්ල කිළිටි වෙයි. අනිත්‍ය මෙනෙහි වෙයි.

ගුරුවරයකු වශයෙන් බුදුරජාණන් වහන්සේ කායික දඬුවම් දීමක් නැත. මානසික දඬුවම් අවස්ථාවෝචිත පරිදි දෙනු ලැබී ය. ''බ්‍රහ්මදණ්ඩනය'' උපරිම දඬුවම ය. එය පැනවූයේ ඡන්න තෙරුන්ට ය. දඬුවමක් පනවන්නේ ද හික්මවා ගතහැකි අයට පමණි. යසෝජ ප්‍රමුඛ තෙරවරු දුර බැහැර සිට සවස් බාගයෙහි ජේතවනාරාමයට පැමිණෙති. ආසන පැනවීමේ දී මහත් සෝසාවක් ඇති විය. අනඳ හිමි ඇමතු බුදුහිමියෝ ''කුමක්ද? ඔය උස් හඬ, මසුන් මරන තැන කෙවුලන් කෑ ගසනු මෙනි. **(කේවට්ට, මඤ්ඤේ මච්චවිලෝපේ)** වහාම අරමින් පිටව යන්නැයි ඔවුනට නියම කළහ. උන්වහන්සේ ද තමන් ගේ වරද පිළිගෙන අරමින් බැහැර ගොස් භාවනා කොට රහත් වූහ. නැවත පැමිණි විට බුදු හිමියෝ ඒ තෙරවරුන් සමඟ රාත්‍රි කාලය ම සමාධි සුවයෙන් ගත කළහ.

බුදුරජාණන් වහන්සේ ගේ ඉගැන්වීම් ක්‍රමය මනෝවිද්‍යාත්මකව සකස් වූවෙකි. ආනුපුබ්බී කථාව හෙවත් අනුපිළිවෙළ කතාව එයට හොඳ නිදසුනක් වශයෙන් දැක්විය හැකි ය. ''දාන කථං, සීලකථං, සග්ගකථං, කාමානං ආදීනවං.'' ආදී වශයෙන් එම කථන මාර්ගය සකසා ඇත. මනුෂ්‍යයෝ

තමා පිළිබඳව තම වස්තුව පිළිබඳව මමායනයකින් ජීවත් වෙති. එය බොහෝ කාලයක සිට පැවත එන බැඳීමකි.

මේ බැඳීම කඩන්නට නම් ඊට වැඩි වටිනාකමක් ඇති බැඳීමක් සිතට ඇතුළු කළ යුතු ය. මේ නිසා දන් දීමෙහි සිල් රැකීමෙහි අනුසස් වශයෙන් ලැබෙන දිව්‍ය සම්පත්තිය පිළිබඳ වර්ණනාවක යෙදෙති. එවිට පරණ බැඳීම ලිහිල් වී අලුත් වඩා වටිනාකමක් බැඳීමක් සිතට පිවිසෙයි. කාමයන්ගේ ආදීනව, කෙලෙස් සහිත බව වෙනස් වන ස්වභාවය පැහැදිලි කර දෙති. එනිසා පැලපැදියම් වූ ලිහිල් වූ පරණ බැඳීමත් අලුතින් පිවිසුණු බැඳීමත් නැති වී නික්මීමේ ආනිශංස පිළිබඳව සිත යොමු වේ.

නන්ද තෙරුන් පිළිබඳව අනුගමනය කොට ඇත්තේ ද මේ මනෝවිද්‍යාත්මක ක්‍රමවේදය යි. නන්ද කුමරු ජනපද කල්‍යාණි සමඟ පෙමින් වෙළී සිට විවාහ වන දිනයේ දී උපක්‍රමයෙන් විහාරයට කැඳවාගෙන ගොස් පැවිදි කරන ලදි. නන්ද බුදුරදුන් සමඟ යනු දුටු ජනපද කල්‍යාණිය නා හිස පීරමින් උඩුමහල් තලයේ සිට'' ගියාට කමක් නෑ ඉක්මනට එන්න' යැයි කීවා ය. මහණ වී භාවනා කරන විට සිහිපත් වන්නේ ම ජනපද කල්‍යාණිය කී වදනයි. මේ නිසා නන්ද හිමි සිවුරු හැරීමට කල්පනා කරන බව දැනගත් අනෙක් භික්ෂූහු උන්වහන්සේ බුදුරදුන් වෙත පමුණුවති. බුදුරජාණන් වහන්සේ නන්ද හිමියන්ගෙන් කිසිවක් නො විමසූහ. නන්ද හිමියන් ද සමඟ දෙව්ලොවට වැඩම කළහ. දෙවියන් සහ දෙවඟනන් පැමිණ බුදුරදුන්ට සහ නන්ද හිමියන්ට වැඳ වැඳ ගියහ. ලස්සන දෙවඟනන් දුටු නන්ද හිමියන්ට දෙවඟනන් පිළිබඳ සිතක් පහළ විය. ඒ දැනගත් බුදු පියාණෝ ''නන්ද, දෙවඟනන් ලස්සන දැයි විමසූ විට ලස්සන යැයි පැවසූ පසු දෙවඟනන් පන්සියයක් ලබාදීමට ඇප වෙති. නැවත මිනිස් ලොවට පැමිණ භාවනාවට

සිත යෙදවීය. දෙවඟනන් ලබා ගැනීමට භාවනාවේ යෙදෙන නන්ද හිමියන්ට අනෙක් හිමිවරු විහිළු තහළු කරති. ලජ්ජාවට පත් නන්ද හිමි හොඳින් භාවනා කළේ ය. ප්‍රතිඵලය වූයේ නොබෝ දිනකින් ම සිව්පිළිසිඹියාපත් මහ රහත් භාවයට පත්විම යි.

ආලවක වැනි දරුණු යක්ෂයන් බුදුරජාණන් වහන්සේ දමනය කළ සේක්, ඔවුන්ට අවනත වී සිතේ පැවති තද ගතිය ලිහිල් කිරීමෙනි. අංගුලිමාල වැනි මිනීමරුවන් කාරුණික වදන් භාවිතයෙන් දමනය කළහ. සච්චක වැනි මානයෙන් මත්ව සිටි බමුණන් වාද මාර්ගයෙන් දමනය කළහ.

බුදුරජාණන් වහන්සේගෙන් ඉගනගත් සැම කෙනෙක් ම අවසන උන්වහන්සේට අවනත භාවයට පත් වූහ. ප්‍රශංසා කළහ. ''භාග්‍යවතුන් වහන්ස, ඔබ වහන්සේ ගේ ඉගැන්වීම ඉතා මැනවි, යටිකුරු කළ භාජනයක් උඩුකුරු කළාක් මෙන්, වැසුණු දෙයක් විවෘත කළාක් මෙන්, මං මුළාවූවකුට පාර කියා දුන්නාක් මෙන්, අන්ධකාරයෙහි පහනක් දැල්වූවාක් මෙන් නන් අයුරින් දේශනා කරන ලදි. අද පටන් මම තිසරණ ගත උපාසකයකු වෙමි''යැයි පවසමින් බෞද්ධ උපාසකයකු බවට පත් වෙයි. බුදුරජාණන් වහන්සේ කෙතරම් දක්ෂ ගුරුවරයකු ද යත් සමහරු උන්වහන්සේ ළඟ ආවර්තනීය මායාවක් ඇති බව පැවසූහ.



# ඒ මගෙ මවු බස

ඉසුඹුලත් ආචාර්යාණි
**පී.කේ. එදිරිවීර මහත්මිය**

---

මා නැළවුණ බස
මන පිනවන බස
හෙළයේ හෙළ බස
ඒ මගෙ මවු බස

උතුරන අම රස
ඇසුවන් වන තොස
හෙළයේ හෙළ බස
ඒ මගෙ මවු බස

හෙළයේ කිතු ගොස
විහිදූ දස දෙස
හෙළයේ හෙළ බස
ඒ මගෙ මවු බස

රුපු'නොද බිඳි බස
ජය හඬ රැඳි බස
හෙළයේ හෙළ බස
ඒ මගෙ මවු බස

ගැදි පැදි සැදි බස
රැඳි නව නළු රස
හෙළයේ හෙළ බස
ඒ මගෙ මවු බස

පැහැදිලි අදහස
සැදි වියරණ රස
හෙළයේ හෙළ බස
ඒ මගෙ මවු බස

කිවිඳුන් පිය බස
පඬිඳුන් රැකි බස
හෙළයේ හෙළ බස
ඒ මගෙ මවු බස

නිරිඳුන් දිනු බස
හෙළයන් සතු බස
හෙළයේ හෙළ බස
ඒ මගෙ මවු බස

තෙරුවන් රැඳි බස
දෙවියන් ලැදි බස
හෙළයේ හෙළ බස
ඒ මගෙ මවු බස

බස'තර අසදිස
සිතුමිණ සරි බස
රකිනෙමි පණ ලෙස
ඒ මගෙ මවු බස

# බෞද්ධ ළමයා
# උපදේශන මණ්ඩපය

**"විදසුන් විසිනි**

---

**ප්‍රශ්නය :**

මම පාඩම් කරන්න කැමතියි. නමුත් පාසලේ කටයුතු හා උපකාරක පන්තිවලට සහභාගී වී එනවිට පාඩම් කිරීමට කාලය මදි. මෙය විසඳා ගැනීමට උපකාර කල මැනවි.

**පිළිතුර :**

දයාබර දුවේ, පුතේ, මෙම ගැටළුවත් බොහෝ දූ පුතුනට තිබෙන ගැටළුවක්. පෙර නම් උසස් පෙළ ආදී උසස් විභාගවලට පෙනී සිටින දරුවන්ට පමණක් තිබූ ගැටළුවක් වුවත් මේ වන විට කුඩා දරුවන් පවා අතිශය කාර්ය බහුල වී තිබෙනවා. සංකීර්ණ සමාජ රටාවක් සමඟ ගනුදෙනු කිරීමේ දී මෙවැනි ප්‍රශ්න පැන නැගීම ස්වභාවික යි. නමුත් කාලය කළමණාකරණය කර ගනිමින් අනාගතයට මුහුණ දිය යුතු වෙනවා.

අප මුලින් ම තේරුම් ගත යුතු දෙයක් තිබෙනවා. එනම් ලෝකයේ සෑම දෙනාටම තිබෙන්නේ අපට හිමිව තිබෙන

පැය විසිහතරම බව. මහා රාජ්‍ය නායකයින්, දැවැන්ත ව්‍යාපාරිකයින්, උගත් මහාචාර්යවරුන් ආදී සෑම දෙනාම මෙම පැය විසිහතරක කාලය තුළ දිවිගෙවන මිනිසුන්. එම නිසා මෙම කාලය භාවිතා කොට විභාගයක් ජය ගැනීම එතරම් අපහසු නැහැ. ලෝකයේ බොහෝ මිනිසුන් මෙම කාලය ම භාවිතා කොට විභාගයට වඩා ජීවන අභියෝග ජයගෙන තිබෙනවා. යමකට අවශ්‍යතාවක් තිබේ නම් ඒ සඳහා කාලය සොයා ගත හැකි ය.

දයාබර දුවේ, පුතේ, පළමුව සාර්ථක කාල සටහනකට පිවිසීම අතිශය වැදගත්. පැය පහක් හයක් අතර උපරිම සීමාවකට තබා ගැනීම වටිනවා. වැඩෙන දරුවෙකුට පැය හයක නින්දක් ප්‍රමාණවත්. දැන් ඉතිරිව තිබෙන පැය දහඅටක් පමණ කාලය හොඳහැටි පිරිමසා ගැනීම අවශ්‍යය යි. එහි දී පැය භාගයේ කොටස්වලට වැඩ කරන මුළු පැය ගණන බෙදා එම කොටස්වලට වෙන වෙනම යෙදෙන කටයුතු ලියා ගන්න. කාලය අපතේ යන අවස්ථා හොඳින් හඳුනා ගන්න. විශේෂයෙන් තමනට අනවශ්‍ය රූපවාහිනී වැඩ සටහන් නැරඹීම. ජංගම දුරකථනයෙන් දීර්ඝ කතා බහවල යෙදීම. නිසරු පුවත් පත් ලිපි කියවීම. පරිගණක ක්‍රීඩා, අන්තර් ජාලයේ face Book වැනි කාලය කා දමන කටයුතු වලින් ඉවත් විය යුතුම ය. ස්නානය කරන විට රෙදි සේදීම ආදියෙනුත් ජංගම දුරකථන ඇමතුමක් ගැනීම සුදුසු අවස්ථාවක කිරීමෙනුත් ආදියෙනුත් කාලය බොහෝ දුරට ඉතිරි කර ගැනීමට අවස්ථාව ලැබෙනවා. අනවශ්‍ය පරිදි ජංගම දුරකථන සංවාදවල යෙදීම වැනි වැඩි වැඩ ගෙන දෙන දැයින් හැකි පමණ මිදෙන්න.

අපේ දූ පුතුන් කරන තව වරදක් තිබෙනවා. එනම් පාඩම් කොට වෙහෙස දැනෙන විට මඳ වේලාවක් විවේක පිණිස යැයි කියමින් නිදා ගැනීම, නිකරුනේ සිටීම, රූපවාහිනී බැලීම,

අන්තර්ජාල ගනු දෙනු ආදියට යොමු වීමයි. පාඩම් කිරීම එක දිගට කිරීම නොහැකි බව සත්‍යයක්. නමුත් එයින් විවේක ගැනීමේ දී කළ යුත්තේ කරන කටයුත්ත වෙනත් ප්‍රයෝජනවත් කටයුත්තකට මාරු කිරීම මිස නිකරුණේ කල් මැරීම නොවෙයි. උදාහරණයක් ලෙස පාඩම් කොට වෙහෙස වන විට කාමරය පවිත්‍ර කිරීමට හැකියාව ඇත. ඉන් අනතුරුව මුව කට දොවා පිරිසිදු වී මඳ වේලාවක් නමුත් භාවනා කොට නැවත පාඩම් මේසයට එළඹිය හැකි යි. මෙහි දී ආනාපානසති භාවනාව වඩා සුදුසු ය. පාසල් හෝ අතිරේක පන්ති ගොස් පැමිණි විටද වෙහෙස දැනෙනවා යැයි කියමින් කල් මැරීම සුදුසු නැහැ. පවුලේ කාටත් තේ පැන් ආදී යමක් සාදා පිළිගන්වා ඔබත් තේ පානය කොට හොඳින් නා පිරිසිදුව එන විට වෙහෙස මඟ හැරී යනවා. කටයුතු කිහිපයක්මත් සපිරෙනවා. කාගෙත් ප්‍රසාදය ඔබට ලැබෙනවා.

මැලි බව උපදින සෑම අවස්ථාවක ම වීර්ය උපදවා ගන්න. එදිනට නියමිත් කටයුතු ඒ ඒ දිනම අවසන් කරන්න. වැඩ ගොඩ වීමට ඉඩ නොදෙන්න. අනවශ්‍ය කටයුතුවලින් බැහැර වන්න. අවශ්‍ය දෑයෙහි පමණක් ම තෝරා බේරා ගෙන යෙදෙන්න. මේ අයුරින් අධිෂ්ඨානයෙන් යුතුව ඒ අධිෂ්ඨානයට අනුරූපී ප්‍රතිඵලය ලබා ගැනීමට වීර්යයෙන් කටයුතු කළ විට ඔබේ සියළු කටයුතු සාර්ථක වෙයි

තෙරුවන් සරණයි.

# සෙන් කතා දෙකක්

**එච්. එම්. මොරටුවගම ශූරීන් විසිනි**

සෙන් ආචාර්යවරයාගේ කාර්යය ශිෂ්‍යයා උන් මාර්ගයෙන් සන් මාර්ගයට ගැනීම ය. එහිලා දීර්ඝ බණ දේශනා ඔහු අනුගමනය නො කරයි. මෙරමාගේ චර්යාව කෙරෙහි සූක්ෂ්මාත්මාවබෝධයක් ලත් විචක්ෂණ සෙන් ආචාර්යවරයා ඒ සඳහා අතිශය සංක්ෂිප්ත මාර්ගයක් අනුගමනය කරයි. මතු දැක්වෙන කතා පුවත් ඒ බැව් අපට හඬගා කියයි.

''සෙන්ගායි වෙත භාවනා ඉගෙන ගනිමින් සිටි සිසුන් අතුරින් එක් අයෙක් මැදියම් රැයෙහි පිබිදී පන්සලේ තාප්පයෙන් පැන විනෝදයට නගරයෙහි ඇවිදීමට පුරුදු ව සිටියේ ය.

එක් රැයක් සෙන්ගායි, ගෝලයන් ගැන පරීක්ෂා කරන විට මොහු ඇඳෙහි නො සිටි බවත්, උස කනප්පුවක් තබා තාප්පයෙන් පැන ගොස් ඇති බවත් දැන ගත්තේ ය. සෙන්ගායි කනප්පුව ඉවත් කොට තාප්පය ළඟ වාඩි වී සිටියේ ය.

ගමන නිම කොට පෙරළා පැමිණි ගෝලයා කනප්පුව යැයි සිතා ගුරුවරයාගේ හිසේ පය තබා තාප්පයෙන් පැන ගත්තේ ය. තමා කෙළේ කුමක් දැයි දැන ගත් විට හෙතෙම බෙහෙවින් තැති ගත්තේ ය.

''උදේ පාන්දර හරියට පින්න, පරෙස්සම් වෙන්න. හෙම්බිරිස්සාව හැදෙන්න පුළුවන්''යි ගුරුතුමා පැවසී ය. ගෝලයා ඉන්පසු කිසි දිනෙක රෑ ඇවිදින්නට නො ගියේ ය.

සැඩ පරුෂ සොරකු දැහැමි පුද්ගලයකු බවට පත් කරගනු ගැබූ පුවතක් සෙන් කතා අතර දක්නට ලැබෙයි. බුදුරජාණන් වහන්සේ ගේ 'පුරිසදම්මසාරථී' ගුණය අපේ සිහියට නඟන ඒ පුවත ද සෙන් ආචාර්යවරුන් විසින් අනුදත් ශික්ෂණ මාර්ගය මනා ව විදහා දක්වයි.

'එක් සැන්දෑවක ශිෂිරි කෝජුන් පිරිත් සජ්ඣායනා කරමින් සිටින විට තියුණු කඩුවක් රැගෙන හොරෙක් පැමිණ, ''හොඳ හිතින් තමුසේ ළඟ තියෙන මුදල් දෙනවා, නුදුන්නොත් මරනවා '' යි තර්ජනය කෙළේ ය.

ශිෂිරි සිටි පියවරෙහි ම නො සැලී සිට මෙසේ තෙපළේ ය.

''මට කරදර කරන්න මහන්සි වෙන්න එපා. අර ලාච්චුවේ සල්ලි ඇති ගන්න'' යි පැවසූ හේ නැවත වරක් පිරිත් සජ්ඣායනය ඇරඹී ය. මඳ වේලාවක් පිරිත් සජ්ඣායනා කළ ශිෂිර නිහඬ ව සිට සොරා ඇමතී ය.

''සල්ලි ඔක්කොම ටික නො ගත්තොත් හොඳයි. හෙට වරිපණම් බදු ගෙවන්නත් තියෙනවා. ඒකට කීයක් හරි ඉතිරි කළොත් ලොකු උදව්වක්.''

සොරා කිසිදු කතාවක් නොමැති ව මුදලින් කොටසක් පොදි බැඳගෙන යන්නට පිටත් විය. ග360

ශිෂිර : තෑග්ගක් ලැබුණහම දුන්න මනුස්සයට ස්තුතියක් කරන්න පුරුදු වුණොත් ඒක

බොහෝම හොඳ චාරිද්දරයක්.

හොරා : කළ උදව්වට බොහෝම ස්තුතියි !

සොරා එතැනින් බැහැර ව ගියේ ය.

ටික දිනකට පසු ඔහු පොලිස් අත්අඩංගුවට ගනු ලැබිණි. පොලිසිය වෙත තමා කළ සියලු හොරකම් පිළිබඳ පාපොච්ඡාරණයක් කළ හේ ශිෂිර කෝජුන්ගෙන් ගත් මුදල් ගැන ද සඳහන් කෙළේ ය. එම නිසා ඔහුට විරුද්ධ නඩුවෙහි සාක්කිකරුවකු වශයෙන් ශිෂිර ද උසාවිය වෙත කැඳවනු ලැබිණි.

මගේ හිතේ හැටියට මේ මනුස්සයා හොරෙක් නෙමෙයි. මමයි ඒ මනුස්සයට සල්ලි දුන්නේ. ඒ මනුස්සයා කට පුරා ස්තුතියකුත් කරලයි ගියේ''

ශීෂිරි කෝජුන්ගේ සාක්කිය එ පමණි.

හොරා හිරගෙට නියම විය. හිර ගෙදරින් නිදහස ලබා පිටත් වූ හේ ශිෂිරි වෙත පැමිණියේ, ගෝලයකු වී භාවනා පුහුණු වීමට පටන් ගත්තේ ය.''

